බුදුන්ගේ කාලයේ උපතිස්ස, කෝලිත කියල ගම් දෙකක් තිබුණා. ඒ දෙකේ ප්‍රධාන පවුල් දෙකේ උදවිය හැඳින්වුණේ ඒ ගම්වල නම් වලින්. ඒ පවුල් දෙකේ පුත්තු දෙන්නෙක් හරි යාළුයි. ඒ දෙන්නව හැඳින්වූයෙත් ඒ ගම්වල නම්වලින්. උපතිස්ස හුඟක් සුදුයි. හැබැයි කෝලිත කළුයි. ඒ දවස්වල සුදු අය උසස් ආර්ය කුළවල හැටියට සලකන සිරිතක් තිබුණා. ඒත් හුඟක් උගත් කළු බමුණන් හිටිය නිසා මේක විවාද කරන ප්‍රශ්නයක් හැටියට තිබුණේ. කළු අය දාසයන් හැටියට සලකපු නිසා තරුණයන් අතර මේක ගැටලුවක් වෙලා තිබුණේ.

වුණේ මේ විදියටයි කියල ආචාර්ය සන්තානා පෙන්වල දීල තිබෙනවා.

දැන් මේ උපතිස්සයි, කෝලිතයි මේ අදහස් ගැටුම් තිබෙන ලෝකයකටයි ඇතුල් වෙන්නේ. රජගහනුවර සංජය කියන ගුරුවරයත් පෙරලිකාරී අදහස් දැක්වූ කෙනෙක්. මේ ජෝඩුව ඉස්සෙල්ලාම එයාට එකතු වෙලා එයා ළඟ මහණ වුණාත් එදා තිබුණ නගරවල හැම තැනම ඇවිදල සත්‍යය සොයා ගිහින් තිබෙනවා. ඒ

# ඉතිහාසය මොන තරම් විශ්මයජනකද?

එදා තිබුණ සම්ප්‍රදායික හින්දු ආගම අනුව බමුණු කුළවල අය මහ බඹාගේ ඔළුවෙන් උපන් රන්වන් කෙස් ඇති, නිල් ඇස් ඇති, කිරිපාට වර්ණ ඇති අය හැටියට සැලකුවා. ඒත් පවතින තත්ත්වය මේ අර්ථ දැක්වීම්වලට ගැලපුනේ නෑ. කුළවලින් ගුණ පෙන්නුම් කරනවාද, නැත්නම් පරම්පරාවල් පෙන්වනවද? බමුණු, රාජ, සිටු ආදී වශයෙන්




දවස්වල කරත්ත වලින් දුර පළාත්වලට යන්න පුළුවන් කම තිබුණා. සමහරවිට අස්ස කරත්තත් තිබුණා. ඇත්තටම ඒ කාලේ පර්සියාවේ ඩේරියස් රජ්ජුරුවෝ එයාගේ අධිරාජ්‍යය පුරාම අස්ස කරත්ත වලින් එහා මෙහා යාමට ප්‍රවාහනය සකස් කරල තිබුණා. ඒවා අනුකරණය කරල ඉන්දියාවේ රජවරුන්, සිටුවරුන් ප්‍රවාහනයත් සකස් කරල තිබුණ බව පෙනෙනවා. ඒ දවස්වල දේව යනුවෙන් හැඳින්වූයේ පර්සියානු (ඉරාන) අධිරාජ්‍යයේ හිටපු ජනතාව බවයි එළිවෙලා තියෙන්නේ. ඒ නිසා අවුරුදු ගණනවාක් ගෙවල මේ විදියට කරුණු කාරණා හොයා බැලීමට මේ දෙන්නා ගියා කියල අපට පිළිගන්න වෙනවා. අනෙක් අතට ඒ විදියට මහණ වූ පුද්ගලයන්ට අදහස් උදහස් විමසන්න කරදරයක් තිබුන බවක් පෙනෙන්නේ නෑ. කුල භේද හා ගැටුම තිබුණත් කතාබහට ලොකු ඉඩකුත් තිබිල තියෙනවා. සිදුහත් කුමරත් මේ විදියට සත්‍ය සොයා යනකොට ආරවුල් වුණ බවක් පෙනෙන්නේ නෑ.

මේ දවස්ල රජගහ නුවර අස්සජී හාමුදුරුවෝ ඉඳල

යම් භාවිතයක් පෙන්නුවත් උපතින් එකට බැඳීමක් තිබුණ බවයි සමාජ පිළිගැනීම වුණේ. බමුණා ආගම දහම හා ධර්මය ගැන ප්‍රවීනයෙක් නම් එවැනි උගත්කමක් වෙන පවුලකට ගන්න බැරි ඇයි කියන ප්‍රශ්නය මතු වුණා. ඇයි මිනිස් ගුණාංග මිනිස් ඇඟේ ලක්ෂණවලට මාට්ටු කරන්නේ? කළු මිනිසෙකුට බුද්ධිමත් වෙන්න බැරිද? විශේෂයෙන් ඉන්දියාවේ මේ කාලයට පෙර යුගයේදී සමාජ දෙකක් අතර ගැටුමක් වගේම එකමුතුවීමක් තිබුණා. මොහෙන්දජාරෝ වගේ පෙදෙස්වල තිබුණ ලොකු ශිෂ්ඨාචාරයත් කඩා වැටිල තිබුණ මේ වෙනකොට. ඒ වගේම තැන් තැන්වල ඇවිදින ගොපළු සමජයකුත් මෙතැනට ඇවිත් තිබුණා. ඒ උදවිය ආර්යවරු, ඔවුන් එයින් ඉස්සර හිටපු අය යටපත් කරගත්තා කියල සමහරු හිතනවා. ඒත් බලවත් සංවිධානය වුණු ශිෂ්ඨාචාරයන් තැන් තැන්වල ඇවිදින ගොපළුන් හට බිඳ දමන්න හැකි වුණාද? නැත්නම් ගොවි ශිෂ්ඨාචාරය බිඳ වැටෙමින් තිබුණ නිසා ගොපළුන්ට ඇතුළු වෙන්නට ඉඩ ලැබුණාද?

හැබැයි කොහොමටත් මේ අපි විමසන කාලේ වෙනකොට හින්දු සම්ප්‍රදායික අදහස්වලට තරුණයෝ ලොකුවට අභියෝග කරන්න පටයන් අරන්. බුදුන් විතරක් නෙවෙයි තව ගුරුවරු ගණනවාක් බමුණු මතයට විරුද්ධව හිටියා. මේ හැම දෙනෙක්ම වේද පොත්වල තිබෙන අදහස්වලට විරුද්ධව මොහෙන්දජාරෝ යුගයේ සම්ප්‍රදාය උඩ ඉඳලයි අදහස් දැක්වූයේ. භාවනාව, විශ්වය, අනන්තය ආදී අදහස් ඉදිරිපත්

**NAATI ACCREDITED (LEVEL 3)**
**PROFESSIONAL TRANSLATOR**

FOR ALL YOUR TRANSLATIONS

Birth Certificates
Marriage Certificates
Death Certificates
Educational Certificates
National Identity Cards
Legal and Other Documents

Contact
Dr Prema Kudaligama
(03) 9467 1658
0458 60 60 66

Address
3 Moore Court
Bundoora Vic 3083
Australia

තියෙනවා. අස්සජී සාදු බුදුන්ගේ ගෝලයෙක්. ප්‍රධාන අසූ දෙනාගෙන් කෙනෙක්. ඒ වගේම පස්වග මහණුන්ගෙන් කෙනෙක්. ඒත් ඒ සාදු සදාකාලිකව මතක හිටින්නේ මේ සිද්ධිය නිසා. ඒ ගැන තමා මන් මේ ලියාගෙන යන්නේ. උපතිස්ස මහණත් ටවුමේ ඉන්න වෙලාවක අස්සජී සාදු පිණ්ඩපාතේ එකතු කරගෙන යනව දැකල තියනවා. උපතිස්සට, කෑම ඉල්ලගෙන ගෙන්ගෙට යන විදිය අල්ලල ගිහින් තියෙනවා. මොකද? කුල, වංශ භේදයක් නැතිව හැම ගෙදරකටම, මග

*<u>මුළු විශ්වය ගැනම ඉතාම මූලික නියමය මෙයින් පැහැදිලි කළා. ඒ තමා හේතු උත්පාදක නියමය. මැවුම්කරුවන් මෙන්ම ආත්මවාදයද මේ නියමයෙන් සුන් වෙනවා.</u>*

හැරීමක් නැතිව හිඟාගෙන යන එකත් ඉතාම ප්‍රජාතන්ත්‍රවාදී වැඩක්. කුල භේදය, ආගම් විසින්ම ඉදිරිපත් කරන කාලයක ඒ විදියට භය නැතිව යන ගමන ගැන උපතිස්ගේ හිත ඇදුන එක ගැන අහන්න පුදුම දෙයක් නෙවෙයි. මෙයා නම් බලවත් ධර්මයක් අනුගමනය කරන කෙනෙක් කියල එයාට හිතිල තියෙනවා. ඒ වුණාත් කෑම එකතු කරන වෙලාවක කථාබහ කරන එක වැරදියි කියල උපතිස්සට හිතුණා. ඒක හරි. මොකද? බඩගින්නෙ මොනම දෙයක් වත් කතාකරන්න බෑ. බඩගින්න උඩ මිනිසා කඩා වැටෙනවා. හිඟා ගත් කෑම වේල බඩට දාගන්න කල් ඉන්නම ඕනෑ. මේ වැදගත් සිරිත මිනිසා ඇති වුණ ඈත ඉතිහාසයේ ඉඳන් එන එකක්.

අස්සජී සාදු කෑමට ලෑස්ති වෙන කොට උපතිස්ස තමන්ගේ තියෙන කොට්ටය හරි ගස්සල වාඩි වෙන්න හදල දීල තියෙනවා. ඒ කාලේත් ඉගෙනීම කරන අය මල්ලක්, වාඩි වෙන්න පොඩි කොට්ටයක්, වතුර කෙණ්ඩියක්, පන්දමක් ආදිය ගෙනියනවා. ඉතාම සදාචාරශීලීව උපතිස්ස වාඩිවෙන්න හදල දීල, තමන්ගේ වතුර සාදුට බොන්න දීල, සලකල තමයි කථාවට බැස්සේ.

සාදු හරිම හිත ඇදෙන විදියටයි හැසිරෙන්නේ. ඔයා කාගේ ගෝලයෙක්ද කියල කියන්න පුළුවන්ද? කියල උපතිස්ස බොහොම ආදරයෙන් ඇහැවුවා. අස්සජී සාදුට තේරුණා මෙයා විරුද්ධ මතයක් දරන, හොයා බලමින් ඉන්න කෙනෙක් බව. මෙයාට ගැඹුරුම තැනකි-

41 වන පිටට




සඳ රේණු සැඟවෙන්න
මගේ නෙත් නොරැරැක්ෂෙන්න
තරු ඇසුත් පියවෙන්න
ඉඟි බිඟිය නොපෙනෙන්න
නවතින්න නැවතෙන්න
පියැවෙන්න නෙතු පිය මගේ

වලාකුළු දුව එන්න
අහස් ගඟ පුරවන්න
සළුවක්ව ඇතිරෙන්න
තිමිරරැයව පැතිරෙන්න
නෙතු පියා නිදියන්න
සැනසෙන්න මට මේ රැයේ

කඳුළු මල් විතරමයි
සුසුම් සුවඳයි තමයි
එපා මා හරැවන්න
අද නොහැක සරසන්න
කැකුළු මල් විසුරුවා
පුදසුනේ මගෙ ආදරේ

තුෂර බිඳු දරා අත
වලාසළු අගින් බැස
හෙමින් විත් සිප ගන්න
විඩාබර මා දෙනෙත
සිහිනයක හංගන්න
ලියැවෙන්න කවි වැල් සිතේ

මද්දහනෙ රිවි කිරණ
රිදවු නෙතු දිය දොවා
රැයේ සළුවෙන් වසා
පියාපත් පුබුදුවා
කොඳුරන්න සවනතට
ගී තනුව ගැයෙනා උදේ

In the night of weariness let me give myself up to sleep without struggle, resting my trust upon thee.

Let me not force my flagging spirit into a poor preparation for thy worship.

It is thou who drawest the veil of night upon the tired eyes of the day to renew its sight in a fresher gladness of awakening.

. .

*රබින්ද්‍රනාත් තාගෝරයන්ගේ ගීතාංජලී කාව්‍යයේ ඉංග්‍රීසි පරිවර්තනයේ පද්‍යයන්හි අනුවර්තනයකි.*

රන්සිරිමල් ප්‍රනාන්දු